දකුණු පළාතේ උසස් පෙළ වාණිජ විෂය උගන්වනු ලබන ගුරුවරුන් සඳහා වූ අධ්‍යාපනික වැඩසටහන

ශ්‍රී ලංකා මහ බැංකුව
ප්‍රාදේශීය කාර්යාලය - මාතර

Disclaimer

- The views expressed are author’s own and may not necessarily reflect the institutional view of the Central Bank of Sri Lanka
- The materials provided in this presentation and any comments or information provided by the presenter are for educational purposes only
- Contents of this presentation can not be used for commercial purpose
- The presentation has been prepared by combining several presentations, hence, some data in the presentation may not up to date

පෙළගැස්ම

- මුදල් ප්‍රතිපත්තතිය යනු කුමක්ද, මුදල් ප්‍රතිපත්තිය ක්‍රියාත්මක කිරීමේ උපකරණ සහ පසුගිය වසරවල දී මුදල් ප්‍රතිපත්තතිය ක්‍රියාත්මක වූ ආකාරය
- මුදල් ප්‍රතිපත්තිය ක්‍රියාත්මක කිරීමේ ක්‍රියාවලිය
- රාජ්‍ය ණය සුරැකුම්පත් වෙළෙඳපොළ සහ රාජ්‍ය ණය සුරැකුම්පත් පිළිබඳ හඳුන්වාදීම

මුදල් ප්‍රතිපත්තිය යනු කුමක්ද, මුදල් ප්‍රතිපත්තිය ක්‍රියාත්මක කිරීමේ උපකරණ සහ පසුගිය වසරවල දී මුදල් ප්‍රතිපත්තිය ක්‍රියාත්මක වූ ආකාරය

මුදල් ප්‍රතිපත්තියක් අවශ්‍ය වන්නේ ඇයි?

- භාණ්ඩ හා සේවාවල මිල ස්ථායීතාව ඇති කිරීම මුදල් ප්‍රතිපත්තියේ අරමුණයි
- උද්ධමනය මෙන්ම අවධමනය ද ආර්ථිකයට අහිතකර වේ

උද්ධමනය

නිර්වචනය:

ආර්ථිකයක භාණ්ඩ හා සේවාවල පොදු මිල මට්ටමෙහි අඛණ්ඩ ඉහළ යාම උද්ධමනය ලෙස හැඳින්වේ

මුදල් ප්‍රතිපත්තියක් අවශ්‍ය වන්නේ ඇයි?

- උද්ධමනය තුළින්:
  - මුදලේ වටිනාකම පහළ යයි
  - ජනතාවගේ ජීවන වියදම ඉහළ ගොස් මූර්ත වැටුප් පහළ යයි
- අවධමනය තුළින්:
  - භාණ්ඩ හා සේවා නිෂ්පාදන අධෛර්යවත් වේ
  - ආර්ථික අවපාත තත්ත්වයකට හේතු වේ
  - සේවා වියුක්තිය ඉහළ යයි

ශ්‍රී ලංකා මහ බැංකුවේ ප්‍රධාන අරමුණු

- ආර්ථික සහ මිල ස්ථායීතාව
  - **මිල ස්ථායීතාව යනු සමස්ත මිල මට්ටමේ වෙනස්වීම අඩු සහ ස්ථායී මට්ටමක පවත්වා ගැනීමයි**
  - **ආර්ථිකයෙහි සමස්ත මිල මට්ටම ඉහළ යෑම නැතහොත් උද්ධමනය ආර්ථිකයට අහිතකර වේ**
    - ✓ ජීවන වියදම ඉහළ යෑම සහ ජීවන තත්ත්වය පහත වැටීම නිසා අඩු සහ ස්ථාවර ආදායම් ලබන්නන්ට එය අහිතකර වීම
    - ✓ ඉතිරිකිරීම් හා ආයෝජන අධෛර්යවත් වී ආර්ථික වර්ධනයට අයහපත් බලපෑමක් ඇති වීම
    - ✓ ගෙවීම් මාධ්‍යයක් ලෙස මුදලට ඇති පිළිගැනීම අඩු වීම
    - ✓ සාපේක්ෂ මිල වෙනස්වීම් හඳුනා ගැනීම අපහසු නිසා සම්පත් බෙදාහැරීම අකාර්යක්ෂම වීම
    - ✓ විනිමය අනුපාතය අවප්‍රමාණය වීම හෝ වෙළෙඳ ශේෂය පිරිහීම

ශ්‍රී ලංකා මහ බැංකුවේ ප්‍රධාන අරමුණු

- ආර්ථික සහ මිල ස්ථායීතාව
  - **උද්ධමනය මෙන්ම අවධමනය ද ආර්ථිකයට අහිතකර වේ.**
    - ✓ අවධමනය භාණ්ඩ හා සේවා නිෂ්පාදන අධෛර්යවත් කර ආර්ථික අවපාතයක් ඇති කරයි
    - ✓ සේවා වියුක්තිය ඉහළ යයි
  - **උද්ධමනය හෝ අවධමනය තුළින් ඇතිවිය හැකි අයහපත් ආර්ථික බලපෑම් දුරලීම සඳහා මිල ස්ථායීතාව වැදගත් වේ**
  - **තිරසාර ආර්ථික වර්ධනයක් පවත්වා ගැනීමට ද මිල ස්ථායීතාව අත්‍යවශ්‍ය වේ**
  - **මිල ස්ථායීතාව ළඟා කර ගැනීම සඳහා මහ බැංකුව <u>මුදල් ප්‍රතිපත්තිය</u> ක්‍රියාත්මක කරයි**

ශ්‍රී ලංකා මහ බැංකුවේ ප්‍රධාන අරමුණු

- මූල්‍ය පද්ධති ස්ථායීතාව
  - මූල්‍ය පද්ධති ස්ථායීතාව යනු දේශීය හෝ විදේශීය වශයෙන් ඇතිවිය හැකි කම්පනවලට මුහුණ දී නොසැලී සිටීමට මූල්‍ය පද්ධතියට ඇති හැකියාවයි
  - මූල්‍ය පද්ධතියේ සිදුවන වෙනසකදී එයින් සාර්ව ආර්ථිකයට බලපෑමක් නොවන්නේ නම් එය ස්ථායී මූල්‍ය පද්ධතියක් ලෙස හැඳින්වේ
  - ස්ථාවර මූල්‍ය පද්ධතියක වැදගත්කම:
    - ඉතුරුම් සඳහා විශ්වාසය ඇති කිරීමට
    - මුදල් ප්‍රතිපත්තිය කාර්යක්ෂමව ක්‍රියාත්මක කිරීමට
    - කාර්යක්ෂම මුදල් අතරමැදිකරණය
    - සම්පත් කාර්යක්ෂම අයුරින් බෙදී යාමට

මුදල් ප්‍රතිපත්තිය යනු කුමක්ද?

- මිල ස්ථායීතාව ඇති කිරීමේ අරමුණෙන් මුදලෙහි පිරිවැය (පොලී අනුපාතික) සහ ප්‍රමාණය (මුදල් සැපයුම/ද්‍රවශීලතාව) පාලනය කිරීම



විවිධ රටවල මුදල් ප්‍රතිපත්ති මෙහෙයවීම

උපකරණ → අතරමැදි /මෙහෙයුම් ඉලක්ක → අවසාන අරමුණු

මුදල් ප්‍රතිපත්තිය ක්‍රියාත්මක කිරීමේ විවිධ උපාය

- ව්‍යවහාර මුදල් මණ්ඩල ක්‍රමය
- විනිමය අනුපාතිකය ඉලක්ක කිරිම
- මුදල් සමස්ත ඉලක්ක කිරීම
- බහුවිධ දර්ශක ඉලක්ක කිරීම
- උද්ධමනය ඉලක්ක කිරීම

ශ්‍රී ලංකාවේ වර්තමාන මුදල් ප්‍රතිපත්ති රාමුව

- ශ්‍රී ලංකා මහ බැංකුව සිය මුදල් ප්‍රතිපත්ති රාමුව නම්‍යශීලී උද්ධමන ඉලක්කකරණ රාමුවකට අනුකූලව ක්‍රියාත්මක කරයි
- නම්‍යශීලී උද්ධමන ඉලක්කකරණය (Flexible Inflation Targeting) ලෙස අදහස් වන්නේ මැදි කාලයේ දී මිල ස්ථායීතාව ළඟා කර ගන්නා අතරතුර ආර්ථිකයේ මූර්ත අංශයෙහි ස්ථායීතාව සහ විනිමය අනුපාතිකයෙහි නම්‍යශීලීතාව පවත්වා ගනු ලබන ක්‍රමවේදයකි
- මෙම රාමුව යටතේ පුරෝකථනය ප්‍රතිපත්ති විශ්ලේෂණ පද්ධතියක් (FPAS) පදනම් කරගත් ආකෘතියක සහාය සමග දත්ත පදනම් කරගත් විශ්ලේෂණ මත ඉදිරි දැක්මකින් යුතුව මුදල් ප්‍රතිපත්තිය ක්‍රියාත්මක කරයි

- බරිත සාමාන්‍ය ඒක්ෂණ මුදල් අනුපාතිකය මෙහෙයුම් ඉලක්කය ලෙස පවත්වා ගනිමින් කෙටිකාලීන පොලී අනුපාතික මෙහෙයවීම සඳහා ශ්‍රී ලංකා මහ බැංකුව සිය ප්‍රතිපත්ති උපකරණ භාවිතා කරමින් මුදල් ප්‍රතිපත්තිය මෙහෙයවනු ලබයි.

මුදල් මැවීම සඳහා සීමා තිබිය යුත්තේ ඇයි ?

මුදල් ස්ථාවර අනුපාතයකින් සංසරණය වේ

අවශ්‍ය ප්‍රමාණයට වඩා වැඩියෙන් මුදල් ආර්ථිකයට නිකුත් කළහොත්...

...මහජනතාව අත වැඩියෙන් මුදල් පවතී; භාණ්ඩ හා සේවා වැඩි ප්‍රමාණයක් මිලදී ගැනීමට පෙළඹේ

එහි ප්‍රතිඵලයක් ලෙස සීමාසහිත භාණ්ඩ ප්‍රමාණයක් ලබා ගැනීම සඳහා වැඩි මුදල් ප්‍රමාණයක් පවතී...

භාණ්ඩ හා සේවා මිල ඉහළයෑමට හේතු වේ...

මුදල් උද්ධමනයට බලපායි...

මුදල් සැපයුම

රටක යම් නිශ්චිත අවස්ථාවකදී මහජනයා වෙත ඇති සමස්ත මුදල් තොගය මුදල් සැපයුම වේ



මුදල් පදනම හෙවත් සංචිත මුදල් (RM)

– වගකීම් අංශය

- සංසරණයේ පවතින ව්‍යවහාර මුදල් (C)
  - මහජනයා සහ වාණිජ බැංකු සතු
- මහ බැංකුවේ පවත්නා වාණිජ බැංකු තැන්පතු (CD)
- මහ බැංකුවේ පවත්නා රාජ්‍ය නියෝජිත ආයතනවල තැන්පතු (GAD)

$$RM = C + CD + GAD$$

– වත්කම් අංශය

- මහ බැංකුවේ ශුද්ධ විදේශීය වත්කම් (NFA)
- මහ බැංකුවේ ශුද්ධ දේශීය වත්කම් (NDA)

මේවා වැඩිවීම මත පදනම් මුදල් සැපයුම වැඩි වේ. මේවා අඩු වුවහොත් පදනම් මුදල් සැපයුම අඩු වේ

පදනම් මුදල් සැපයුමේ ප්‍රභවයන්



රටක මුදල් සැපයුම පැවතිය යුතු මට්ටම

- රටකට මුදල් අවශ්‍ය වන්නේ එදිනෙදා ගනුදෙනු සුමට ලෙස පවත්වාගෙන යාම සඳහායි

මුදල් සැපයුමේ වර්ධනය = නාමික දළ දේශීය නිෂ්පාදිතයේ වර්ධනය

- මුදල් සැපයුම අපේක්ෂිත මට්ටමකට වඩා ඉහළ යෑම උද්ධමනය ඉහළ යාමට හේතු වේ

ප්‍රධාන මුදල් ප්‍රතිපත්ති උපකරණ සහ එහි භාවිතය

ප්‍රමාණාත්මක උපකරණ
(Quantitative)

- ප්‍රතිපත්ති පොලී අනුපාතික
  (Policy Rates)
- විවට වෙළෙඳපොළ කටයුතු
  (Open Market Operations)
- ව්‍යවස්ථාපිත සංචිත අනුපාතය
  (Statutory Reserve Ratio)
- බැංකු අනුපාතිකය
  (Bank Rate)

ගුණාත්මක උපකරණ
(Qualitative)

- ශිෂ්ට ප්‍රයෝග
  (Moral Suasion)
- ආන්තික තැන්පතු අවශ්‍යතා
  (Margin Deposit Requirement)
- ණය සීමා
  (Credit Celling)
- ප්‍රති මුල්‍ය පහසුකම් සැපයීම
  (Re-financing)
- විදේශ විනිමය මෙහෙයුම්
  (Forex Transactions)

මුදල් ප්‍රතිපත්ති තීරණ ගැනීමේ ක්‍රියාවලිය

ආර්ථික පර්යේෂණ දෙපාර්තමේන්තුව

(අධීක්ෂණය හා විශ්ලේෂණය)

- මූර්ත අංශය
- විදේශ අංශය
- රාජ්‍ය මූල්‍ය අංශය
- මුදල් අංශය
- ආර්ථික පුරෝකථනය

මුදල් ප්‍රතිපත්ති කමිටුව

(වාර්තා සමාලෝචනය කර මුදල්මණ්ඩලයට නිර්දේශ ලබා දෙයි)

මුදල් පුත්පත්ති උපදේශන කමිටුව පෞද්ගලික අංශයේ අදහස් ලබාගැනීම

මුදල් මණ්ඩලය

(මුදල් ප්‍රතිපත්ති ස්ථාවරය තීරණය කරයි)

මුදල් ප්‍රතිපත්ති ස්ථාවරය ප්‍රකාශයට පත් කිරීම (පුවත්පත් නිවේදන හා මාධ්‍ය සාකච්ඡා)

ප්‍රතිපත්ති ක්‍රියාත්මක කිරීම (දේශීය මෙහෙයුම් කටයුතු හා අනෙකුත් මෙහෙයුම් දෙපාර්තමේන්තු)

ශ්‍රී ලංකා මහ බැංකුව මුදල් ප්‍රතිපත්ති දැඩි කිරීම 2021 අගෝස්තු මස ආරම්භ කරන ලද අතර වර්තමානයේ දී දැඩි මුදල් ප්‍රතිපත්තියක් පවත්වා ගනී...



නිත්‍ය තැන්පතු පහසුකම් අනුපාතිකය	14.50%
නිත්‍ය ණය පහසුකම් අනුපාතිකය	15.50%

මුදල් ප්‍රතිපත්ති තීරණ

(2021 අගෝස්තු සිට)

ප්‍රතිපත්ති පොලී අනුපාතික	↑	10%
ව්‍යවස්ථාපිත සංචිත අනුපාතය	↑	2%
බැංකු අනුපාතිකය	↑	10%
තෝරාගත් ණය උපකරණ මත උපරිම සීමා	✕	ඉවත්කරන ලදී
විදේශ මුදල් තැන්පතු උපකරණ මත උපරිම සීමා	✕	ඉවත්කරන ලද

ඉහළ යන වෙළෙඳපොළ පොලී අනුපාත සහ මුදල් වෙළෙඳපොළේ සැලකිය යුතු ලෙස ඉහළ ද්‍රවශීලතා හිඟය මධ්‍යයේ මූල්‍ය තත්ත්වයන් තවදුරටත් දැඩි වෙමින් පවතී...



Increase in Key Market Interest Rates from 18 August 2021

Interest Rate	Change (percentage points)
Key Policy Interest Rates	10.0
AWCMR	10.4
91-day Treasury bill	27.0
Monthly AWPR	20.5
AWNLR*	16.1
AWNDR*	16.3
AWNFDR*	16.5

*As at August 2022

2009 සිට 2021 වසරේ අවසන් කාලය දක්වා (මාස 154ක් පුරා) තනි ඉලක්කමක මට්ටමේ පැවති උද්ධමනය මෑත මාසවලදී ඉතා ඉහළ මට්ටම් වාර්තා කර ඇත...



Source: Department of Census & Statistics

කෙසේ වුවත්, මෑත මාසවලදී, විශේෂයෙන් විදේශීය අංශයේ ඇති වූ අස්ථාවරතා, දේශීය සහ විදේශීය දෙඅංශයේ ම හට ගත් සැපයුම් අවහිරතා, විනිමය අනුපාතය අවප්‍රමාණය වීම මෙන් ම මීට පෙර ගන්නා ලද ලිහිල් මුදල් ප්‍රතිපත්ති ක්‍රියාමාර්ගවල බලපෑම ද හේතු කොටගෙන උද්ධමනය ඉතා ඉහළ මට්ටම් වාර්තා කර ඇත

දේශීය ආර්ථික ක්‍රියාකාරකම් සැලකිය යුතු පසුබෑමක් වාර්තා කරනු ඇතැයි අපේක්ෂා කෙරේ...



Source: Department of Census & Statistics

- වාර්ෂික පදනම මත 2022 පළමු භාගයේදී ආර්ථිකය 4.8% කින් හැකිළී ඇතැයි ඇස්තමේන්තු කර ඇත
- 2022 දෙවන භාගයේදී ද ආර්ථිකය හැකිළී යනු ඇතැයි අපේක්ෂා කෙරේ
  - මුදල් හා රාජ්‍ය අංශයේ දැඩි කොන්දේසි
  - සැපයුම් අංශයේ සීමාවන් අඛණ්ඩව පැවතීම
  - ව්‍යාපාරික පරිසරය වටා ඇති අවිනිශ්චිතතාවය

මුදල් ප්‍රතිපත්තිය ක්‍රියාත්මක කිරීමේ ක්‍රියාවලිය

මුදල් ප්‍රතිපත්තිය ක්‍රියාත්මක කිරීමේ ක්‍රියාවලිය

මුදල් ප්‍රතිපත්ති කමිටුව

මුදල් සහ සාර්ව ආර්ථික වර්ධනයට අදාළ සියලුම සාධක විශ්ලේෂණය

→ නිර්දේශයන් →

මුදල් මණ්ඩලය

මුදල් ප්‍රතිපත්ති ස්ථාවරය තීරණය කිරීම

↓

මුදල් ප්‍රතිපත්ති තීරණ

↓

මුදල් ප්‍රතිපත්ති සන්නිවේදනය

← මෙහෙයවීම ←

වෙළඳපොළ මෙහෙයුම් කමිටුව

දේශීය මුදල් වෙළඳපොළ සහ විදේශීය විනිමය වෙළඳපොළ සඳහා වන මහ බැංකුවේ ක්‍රියාමාර්ග තීරණය කිරීම සඳහා මෙම කමිටුව දෛනිකව රැස්වේ

දේශීය මුදල් වෙළඳපොළ මෙහෙයුම්

වෙළඳපොළ ද්‍රවශීලතාව මත පදනම්ව බරිත සාමාන්‍ය එක්ෂණ මුදල් අනුපාතිකය හැසිරවීම

විදේශ විනිමය වෙළඳපොළ

විදේශ වෙළඳපොළ ද්‍රවශීලතාව මත පදනම්ව විනිමය අනුපතිකයෙහි විචලතාවන් අවම කිරීම

මුදල් ප්‍රතිපත්තිය ක්‍රියාත්මක කිරීම

දේශීය මුදල් වෙළඳපොළ

මුදල් වෙළඳපොළ සහභාගීවන්නන් හරහා මුදල් ප්‍රතිපත්තිය මෙහෙයවනු ලබයි

මුදල් වෙළඳපොළ සහභාගීවන්නන්

ප්‍රධාන සහභාගීත්ව ආයතන

- බලපත්‍රලාභී වාණිජ බැංකු

රජයේ බැංකු	02
දේශීය පෞද්ගලික බැංකු	11
විදේශීය බැංකු	11
- බැංකු නොවන ප්‍රාථමික අලෙවිකරුවන්	05

- සේවක අර්ථසාධක අරමුදල (සේ.අ.අ.)

ප්‍රධාන වෙළඳපොළ

අන්තර් බැංකු ඒක්ෂණ මුදල් වෙළඳපොළ(Call Market)

- **බලපත්‍රලාභී වාණිජ බැංකු අතරේ පමණි**
- **බොහෝදුරට එක්දින ගනුදෙනු ඇතුළත් වේ**
- **සුරැකුම්පත් රහිත වෙළඳපොළකි**
- **බරිත සාමාන්‍ය ඒක්ෂණ මුදල් අනුපාතිකය (AWCMR)**

ප්‍රතිමිලදී ගැනීමේ වෙළඳපොළ (Repo Market)

- බලපත්‍රලාභී වාණිජ බැංකු, බැංකු නොවන ප්‍රාථමික අලෙවිකරුවන්, සේවක අර්ථසාධක අරමුදල
- බොහෝදුරට එක්දින ගනුදෙනු සිදු වේ
- සුරැකුම්පත් සහිතයි (ප්‍රධාන වශයෙන්ම රජයේ සුරැකුම්පත්)
- බරිත සාමාන්‍ය වෙළඳපොළ ප්‍රතිමිලදීගැනුම් අනුපාතිකය (AWRR)

සහභාගිත්ව ආයතනවලට තම ද්‍රවශීලතා අවශ්‍යතා අන්තර් බැංකු ඒක්ෂණ වෙළඳපොළ හා ප්‍රතිමිලදීගැනුම් වෙළඳපොළ හරහා මෙන්ම මහ බැංකුව විසින් ලබාදෙන පහසුකම් හරහා ද සපුරා ගත හැක .

මුදල් ප්‍රතිපත්තිය ක්‍රියාත්මක කිරීම...

- මුදල් ප්‍රතිපත්තිය ක්‍රියාත්මක කිරීමේ අරමුණ අන්තර් බැංකු ඒක්ෂණ වෙළඳපොළ පොලී අනුපාතය යෝග්‍ය මට්ටමේ පවත්වා තබා ගැනීමයි

මෙහෙයුම් ඉලක්කය

- බරිත සාමාන්‍ය ඒක්ෂණ මුදල් අනුපාතිකය (AWCMR)
- මෙහෙයුම් ඉලක්කය මුදල් ප්‍රතිපත්ති ස්ථාවරය අනුව තීරණය වේ
- ඒ අනුව, මෙහෙයුම් ඉලක්කය ප්‍රතිපත්ති පොලී අනුපාතික කොරිඩෝ මධ්‍යයෙහි පවත්වා ගනු ලබයි
- මුදල් ප්‍රතිපත්ති ස්ථාවරය අනුව, ශ්‍රී ලංකා මහ බැංකුවට අවශ්‍ය අවස්ථාවල දී එය ඉහළ හා පහළ සීමාවේ පවත්වා ගැනීමට ද තීරණය කළ හැකිය
- ශ්‍රී ලංකා මහ බැංකුව මෙහෙයුම් ඉලක්කය සපුරා ගැනීම මුදල් වෙළඳපොළ ද්‍රවශීලතාව කළමනාකරණය හරහා සිදු කරයි

ප්‍රධාන මුදල් ප්‍රතිපත්ති උපකරණ සහ එහි භාවිතය

ප්‍රමාණාත්මක උපකරණ (Quantitative)

- ප්‍රතිපත්ති පොලී අනුපාතික (Policy Rates)
- විවට වෙළෙඳපොළ කටයුතු (Open Market Operations)
- ව්‍යවස්ථාපිත සංචිත අනුපාතය (Statutory Reserve Ratio)
- බැංකු අනුපාතිකය (Bank Rate)

ගුණාත්මක උපකරණ (Qualitative)

- ශිෂ්ට ප්‍රයෝග (Moral Suasion)
- ආන්තික තැන්පතු අවශ්‍යතා (Margin Deposit Requirement)
- ණය සීමා (Credit Celling)
- ප්‍රති මූල්‍ය පහසුකම් සැපයීම (Re-financing)
- විදේශ විනිමය මෙහෙයුම් (Forex Transactions)

ප්‍රධාන මුදල් ප්‍රතිපත්ති උපකරණ සහ එහි භාවිතය...

- සමස්ත ආර්ථිකයේ ණය පරිමාව සහ ණයෙහි පිරිවැය පාලනය කිරීම සඳහා යොදා ගැනෙන ණය පාලන ක්‍රම, ප්‍රමාණාත්මක ණය පාලන ක්‍රම ලෙස දැක්වේ. එම ණය පාලන ක්‍රම ආර්ථිකයේ එක් එක් අංශ කෙරෙහි විශේෂත්වයක් නොදක්වන අතර පොදුවේ සමස්ත ආර්ථිකය ම ඒවායේ බලපෑමට යටත් වේ
- ප්‍රතිපත්ති පොලී අනුපාතික, විවට වෙළඳපොළ කටයුතු සහ ව්‍යවස්ථාපිත සංචිත අවශ්‍යතා නියම කිරීම ප්‍රමාණාත්මක ණය පාලන ක්‍රම වේ
- ආර්ථිකයේ තෝරා ගත් ක්ෂේත්‍රයන් තුළ ණය ගලා යාම් සහ ඒවායේ දිශානතිය හැසිරවීම ගුණාත්මක ණය පාලනය මගින් සිදු වේ. එම පාලන ක්‍රම බොහෝ විට පොදු බලපෑමක් ඇති කරන ඒවා නොව, විශේෂ වශයෙන් තෝරා ගත් අංශ මත පමණක් බලපෑම් ඇති කරයි
- ණය පිළිබඳ ප්‍රමාණාත්මක සීමා කිරීම්, පොලී අනුපාතික පිළිබඳ සීමාවන් නියම කිරීම, ප්‍රති මූල්‍ය පහසුකම් සැපයීම, ආන්තික අවශ්‍යතා නියම කිරීම සහ යහ පෙළඹවීම වැනි දෑ ගුණාත්මක ණය පාලන ක්‍රම වේ

විවට වෙළෙඳ කටයුතු

වෙළඳපොළ,

අතිරික්ත ද්‍රවශීලතාවක් පවතින විට, අතිරික්ත ද්‍රවශීලතාව අවශෝෂණය කර ගැනීමට

හෝ

ද්‍රවශීලතා හිඟයක් පවතින විට ද්‍රවශීලතාව වෙළඳපොළට සැපයීම

සඳහා සහ එමගින් එක්දින පොලී අනුපාතික යෝග්‍ය මට්ටමේ පවත්වා ගෙන යෑම සඳහා විවට වෙළඳපොළ කටයුතු පවත්වනු ලැබේ

විවට වෙළඳපොළ උපකරණ භාවිතය

(a) ද්‍රවශීලතාව අවශෝෂණය කර ගැනීමේ උපකරණ

- ✓ කෙටි කාලීන ප්‍රතිමිලදීගැනුම් වෙන්දේසි (දින 1 – 7)

  (**Short Term Repo Auction (1-7 days)**)

- ✓ කාලීන ප්‍රතිමිලදීගැනුම් වෙන්දේසි (දින 7 කට වැඩි 90 කට අඩු)

  (**Term Repo Auction (More than 7 days less than 90 days)**)

- ✓ භාණ්ඩාගාර බිල්පත්/බැඳුම්කර නිත්‍ය පදනම මත විකිණීම

  (**Outright sales of Treasury Bills/Bonds**)

- ✓ විදේශ විනිමය හුවමාරු වෙන්දේසි (**FX SWAP Auction – Sell-Buy**)

- ✓ මහ බැංකු සුරැකුම් විකුණුම් වෙන්දේසි (**CBSL Securities Sale Auctions**)

විවට වෙළෙඳපොළ උපකරණ භාවිතය...

(b) ද්‍රවශීලතාවය ලබා දෙන උපකරණ

- ✓ කෙටි කාලීන ප්‍රති විකුණුම් වෙන්දේසි (දින 1 – 7)

  (Short Term Reverse Repo Auctions) (1-7 days))

- ✓ කාලීන ප්‍රති විකුණුම් වෙන්දේසි (දින 7 කට වැඩි 90 කට අඩු)

  (Term Reverse Repo Auction) (More than 7 days less than 90 days)

- ✓ භාණ්ඩාගාර බිල්පත්/බැඳුම්කර නිත්‍ය ලෙස මිළදී ගැනීම

  (Outright T-Bill /bond purchase auction)

- ✓ විදේශ විනිමය හුවමාරු වෙන්දේසි (**FX SWAP Auction – Buy-Sell**)

- ✓ මහ බැංකු සුරැකුම් මිලදී ගැනීම (**Buy-Back facility of CBSL Securities**)

මුදල් ප්‍රතිපත්තිය ක්‍රියාත්මක කිරීමේ අරමුණ අන්තර් බැංකු ඒක්ෂණ වෙළඳපොළ පොලී අනුපාතය යෝග්‍ය මට්ටමේ තබා ගැනීමයි

නිත්‍ය පහසුකම්

- නිත්‍ය තැන්පතු පහසුකම් අනුපාතිකය (SDFR)
- නිත්‍ය ණය පහසුකම් අනුපාතිකය (SLFR)

- ප්‍රතිපත්ති පොලී අනුපාතික අඩු වැඩි කිරීම මගින් ආර්ථිකයේ අනෙකුත් පොලී අනුපාතික කෙරෙහි වක්‍ර ලෙස බලපෑම් කළ හැකිය
- මුදල් ප්‍රතිපත්තිය ක්‍රියාත්මක කිරීම සඳහා යොදාගනු ලබන ප්‍රධාන උපකරණ වනුයේ, මුදල් වෙළඳපොළ තුළ එක් දින පොලී අනුපාතිකවල ඉහළ සහ පහළ සීමා නිර්ණය කරනු ලබන, මහ බැංකුවේ නිත්‍ය තැන්පතු පහසුකම් අනුපාතිකය (පෙර ප්‍රතිමිලදී ගැනුම් අනුපාතිකය) සහ නිත්‍ය ණය පහසුකම් අනුපාතිකයයි (පෙර ප්‍රතිවිකුණුම් අනුපාතිකය)
- මුදල් ප්‍රතිපත්ති ස්ථාවරය පිළිබඳව සංඥා නිකුත් කරනු ලබන යාන්ත්‍රණය වන ප්‍රතිපත්ති පොලී අනුපාතික විධිමත් පදනමක් මත, එනම් සාමාන්‍යයෙන් වසරකට අට වරක් (08) මහ බැංකුව විසින් සමාලෝචනය කරනු ලබන අතර, අවශ්‍ය වන්නේ නම් එම අනුපාතික සංශෝධනය කරනු ලැබේ
- නිත්‍ය තැන්පතු පහසුකම යටතේ සහභාගිත්ව ආයතන සතු අතිරික්ත මුදල් මහ බැංකුවේ තැන්පත් කළ හැකිවේ.
- නිත්‍ය ණය පහසුකම යටතේ සහභාගිත්ව ආයතන වලට සුරැකුම්පත් තබා මහ බැංකුවෙන් මුදල් ණයට ගත හැකිය.
- දැනට පවතින SDFR SLFR අනුපාත වන්නේ පිළිවෙලින් 14.5 % සහ 15,5 % කි.

ව්‍යවස්ථාපිත සංචිත අවශ්‍යතාව

- වාණිජ බැංකු විසින් තම රුපියල් තැන්පතු වගකීම්වලින් මහ බැංකුවෙහි තැන්පතුවක් ලෙස පවත්වාගෙන යා යුතු ප්‍රමාණය.
- මුදල් නීති පනතේ 93 වගන්තිය යටතේ , වාණිජ බැංකු විසින් පවත්වාගෙන යනු ලබන රුපියල් තැන්පතු වලින්, ශ්‍රී ලංකා මහ බැංකුව මගින් නිශ්චය කරනු ලබන අනුපාතිකයකට සංචිතයක් මහ බැංකුවෙහි පවත්වාගෙන යා යුතු වේ. එය හඳුන්වන්නේ ව්‍යවස්ථාපිත සංචිත අවශ්‍යතාව යනුවෙනි.
- දැනට, සෑම වාණිජ බැංකුවක් විසින්ම සියලුම රුපියල් තැන්පතු වලින් 4% ක් මහ බැංකුවේ සිය ගිණුම්වල පවත්වාගෙන යා යුතුයි.



ව්‍යවස්ථාපිත සංචිත අවශ්‍යතාව

ව්‍යවස්ථාපිත සංචිත අනුපාතය වැඩි කිරීම

අධි සංචිත අඩු වේ.

↓

ණය මැවීම අඩු වේ.

↓

ණය දීමේ හැකියාව අඩු වේ.

↓

මුදල් සැපයුම අඩු වේ.

↓

උද්ධමනය අඩු වේ.

ව්‍යවස්ථාපිත සංචිත අනුපාතය අඩු කිරීම

අධි සංචිත වැඩි වේ.

↓

ණය මැවීම වැඩි වේ.

↓

ණය දීමේ හැකියාව වැඩි වේ.

↓

මුදල් සැපයුම වැඩි වේ.

↓

උද්ධමනය වැඩි වේ.

බැංකු අනුපාතිකය

- අවසාන ණය දෙන්නා (Lender of Last Resort) වශයෙන් මහ බැංකුව වාණිජ බැංකුවලට ණය දීමේදී අය කරන පොලිය.
- මෙම ණය සුරැකුම් මත පදනම් වේ.
- 2019 මැයි 31 දින සිට බැංකු අනුපාතිකය පදනම් අංක +300 ක ආන්තිකයක් සහිතව නිත්‍ය ණය පහසුකම් අනුපාතිකය හා අනුකූලව ස්වයංක්‍රීයව ගැලපීම සිදුකෙරේ.
- වර්තමානයේ මෙම අනුපාතිකය 18.5% ක් ලෙස පවතී.

ශිෂ්ට ප්‍රයෝග (යහ පෙළඹුම්)

- වාණිජ බැංකුවල පොලී අනුපාතික, ණය ලබාදිය යුතු ප්‍රධාන අංශ හෝ ඒ සම්බන්ධ කරුණු පිළිබඳව වාණිජ බැංකු සමග පවත්නා සාකච්ඡාවල දී තොරතුරු හුවමාරු කරගැනීම.

රාජ්‍ය ණය සුරැකුම්පත් වෙළෙඳපොළ සහ රාජ්‍ය ණය සුරැකුම්පත් පිළිබඳ හඳුන්වාදීම

රාජ්‍ය ණය සුරැකුම්පත් වෙළෙඳපොළ සහ රාජ්‍ය ණය සුරැකුම්පත් යනු:

- රජය විසින් නිකුත් කරනු ලබන,
- ගනුදෙනු කළ හැකි,
- රාජ්‍ය වගකීම සහිත,
- ප්‍රායෝගිකව ගෙවීම පැහැර හැරීමේ අවදානමක් රහිත

ණය උපකරණයක් ලෙස හැඳින්විය හැක.

රාජ්‍ය ණය හා ණය කළමනාකරණය

- ජාතික ආර්ථිකයේ පවතින අයවැය හිඟය හේතුවෙන් එම හිඟය පියවීම සඳහා රජයට ණය ගැනීම අත්‍යවශ්‍ය වී ඇත
- නිදහසින් පසු මේ දක්වා කාල සීමාව තුළ වසර 2ක් හැර ඉතිරි වසර සියල්ලේ ම රාජ්‍ය අය වැය හිඟයන් වාර්තා වී ඇත
- එහි ප්‍රතිඵලයක් ලෙස රජය විසින් එම අය වැය හිඟය පියවීම සඳහා ණය ලබා ගැනීම සිදු කරනු ලැබේ

විචක්ෂණශීලී අවදානම් මට්ටමක් තුළ අවම පිරිවැයක් යටතේ රජය මූලය අවශ්‍යතා සපුරාලීම රාජ්‍ය ණය කළමනාකරණයයි.

දේශීය හා විදේශීය ණය උපකරණ

දේශීය ණය උපකරණ

කෙටි කාලීන ණය උපකරණ

- ✓ **භාණ්ඩාගාර බිල්පත්**

මධ්‍ය හා දිගු කාලීන ණය උපකරණ

- ✓ **භාණ්ඩාගාර බැඳුම්කර**
- ✓ **ශ්‍රී ලංකා සංවර්ධන බැඳුම්කර**

විදේශීය/බාහිර ණය උපකරණ

- ✓ **වෙළෙඳපොළ ණය**
  - ජාත්‍යන්තර ස්වෛරීත්ව බැඳුම්කර
- ✓ **වෙළෙඳපොළ නොවන ණය**
  - ව්‍යාපෘති ණය
  - වැඩසටහන් ණය
  - භාණ්ඩ ණය

ප්‍රාථමික අලෙවිකරණ පද්ධතිය

- රාජ්‍ය සුරැකුම්පත් කටයුතු සිදුකරනු ලබන විශේෂිත මූලය අතරමැදිකරුවන් ප්‍රාථමික අලෙවිකරුවන් ලෙස හැඳින්වේ.
- ශ්‍රී ලංකා මහ බැංකුවේ මුදල් මණ්ඩලය විසින් ප්‍රාථමික අලෙවිකරුවන් පත් කරන අතර රාජ්‍ය සුරැකුම්පත් පිළිබඳ ප්‍රාථමික වෙළඳපොළෙහි කටයුතු කිරීමට විශේෂිත හිමිකමක් ඇත.
- ඔවුනොවුන් වෙනුවෙන් හෝ ඔවුන්ගේ ගනුදෙනුකරුවන් වෙනුවෙන් රාජ්‍ය සුරැකුම්පත් ගනුදෙනු සිදු කිරීම සඳහා සුදුසුකම් ලබයි.
- වර්මානය වන විට සක්‍රීය ප්‍රාථමික අලෙවිකරුවන් ගණන 10 කි. එය බැංකු ප්‍රාථමික අලෙවිකරුවන් 5කින් සහ ස්වාධීන (බැංකු නොවන) ප්‍රාථමික අලෙවිකරුවන් 5කින් සමන්විත වේ.
- බැංකු ප්‍රාථමික අලෙවිකරුවන්ගේ අධීක්ෂණ කටයුතු ශ්‍රී ලංකා මහ බැංකුවේ බැංකු අධීක්ෂණ දෙපාර්තමේන්තුව විසින් සිදු කරන අතර ස්වාධීන (බැංකු නොවන) ප්‍රාථමික අලෙවිකරුවන්ගේ අධීක්ෂණ කටයුතු බැංකු නොවන මූල්‍ය ආයතන අධීක්ෂණ දෙපාර්තමේන්තුව විසින් සිදු කරයි.

ප්‍රාථමික වෙළඳපොළ



ර
ජ
ය
ශ්‍රී ලංකා මහ බැංකුව
රාජ්‍ය සුරැකුම්පත්
විකිණීම සඳහා
වෙන්දේසි පැවැත්වීම
ශ්‍රී ලංකා මහ
බැංකුව
ප්‍රාථමික
අලෙවිකරුවන්
ප්‍රාථමික
වෙන්දේසියේදී තම
සේවාදායකයන්
වෙනුවෙන් ලංසු
ඉදිරිපත් කරයි
ප්‍රාථමික
අලෙවිකරුවන්/සේවක
අර්ථසාධක අරමුදල
මහජනතාව
ආයෝජකයින් ප්‍රාථමික
අලෙවිකරුවන්ගෙන්
මිලදී ගනී
සංස්ථා ආයතන
පවුල් ඒකක
BANK
බැංකු

ද්විතීයක වෙළඳපොළ



ජාත්‍යන්තර සුරැකුම්පත් හඳුනාගැනීමේ අංකය (ISIN)

භාණ්ඩාගාර බිල්පත්

- කල්පිරීමේ කාලය මත පදනම්ව

LKA09120L044

LK - රටේ කේතය

A - සුරැකුම්පත් වර්ගය

091 - කල්පිරීමේ කාල සීමාව (දින)

20 - කල්පිරෙන වර්ෂය (2020)

L - කල්පිරෙන මාසය (දෙසැම්බර්)

04 - කල්පිරෙන දිනය (04)

4 – පිරික්සුම් අංකය

භාණ්ඩාගාර බැඳුම්කර

- කල්පිරීමේ කාලය මත පදනම්ව

LKB00524C150

LK – රටේ කේතය

B – සුරැකුම්පත් වර්ගය

005 - කල්පිරීමේ කාල සීමාව (වර්ෂ)

24 - කල්පිරෙන වර්ෂය (2024)

C - කල්පිරෙන මාසය (මාර්තු)

15 - කල්පිරෙන දිනය (15)

0 - පිරික්සුම් අංකය

භාණ්ඩාගාර බිල්පත්වල විශේෂ ලක්ෂණ

- නිර්ලේඛණ ණය උපකරණයකි
- දින **91, 182** හා **364** කින් කල් පිරේ
- ඉතා ඉහළ ද්‍රවශීලතාවයක් ඇති ණය උපකරණයකි
- කෙටි කාලීන ණය උපකරණයකි
- වෙළඳපොළ මගින් ඵලදා අනුපාතිකය තීරණය වේ
- වට්ටම් කළ වටිනාකම මගින් පොළිය මුලින් ලැබීම ආයෝජනය කිරීම සඳහා ශ්‍රී ලාංකිකයන් හා විදේශිකයින් සුදුසුකම් ලබයි
- සතිපතා බහුමිල වෙන්දේසි මගින් ඉදිරිපත් කරයි
- ප්‍රාථමික අලෙවිකරුවන් හා බලපත්‍රලාභී වාණිජ බැංකු හරහා ද්විතීයක වෙළඳපොළ ක්‍රියාත්මක වීම

භාණ්ඩාගාර බැඳුම්කරවල විශේෂ ලක්ෂණ

- නිර්ලේඛණ ණය උපකරණයකි
- මධ්‍ය කාලීන සිට දිගු කාලීන ණය උපකරණයකි
- වෙළඳපොළ මගින් ඵලදා අනුපාතිකය තීරණය වේ
- ස්ථිර පොළිය (අර්ධ වාර්ෂික)
- යම්තාක් ද්‍රවශීල ණය උපකරණයකි
- බහුමිල වෙන්දේසි මගින් ඉදිරිපත් කරයි
- ප්‍රාථමික අලෙවිකරුවන් හා බලපත්‍රලාභී වාණිජ බැංකු හරහා ද්විතීයක වෙළඳපොළ ක්‍රියාත්මක වීම

භාණ්ඩාගාර බිල්පත් සඳහා ප්‍රතිලාභ ලැබෙන ආකාරය

- කෙටි කාලීන ණය උපකරණයකි.
- උපරිම වසරක් තුළ ප්‍රතිලාභ ලැබේ (දින 91, දින 182 හා දින 364).
- ප්‍රතිලාබ ලැබීම පිළිබඳ අවදානමක් නොමැත.
- කල්පිරෙන අවස්ථාවේදී ආයෝජනය කරන ලද මුදල හා ඊට අදාල ප්‍රතිලාභය ලැබේ.

- $$Y = \frac{100(FV - P) * n}{P}$$

- මෙහි,

FV - මුහුණත අගය

P - මිල

n - කාලය

Y - ඵලදාව

භාණ්ඩාගාර බිල්පතක ඵලදාව - උදාහරණයක්

- කල්පිරීම් කාලය දින 182
- වෙළෙඳපොල ඒකක මිල රු. 95/-
- රු. 100,000/- වටිනා භාණ්ඩාගාර බිල්පත් රු. 95,000/- කට මිලදී ගනී
- දින 182 අවසානයේ රු. 100,000/- ලැබේ

- ගණනය කිරීම...

$$\text{ඵලදා අනුපාතිකය} = \frac{\text{වට්ටම}}{\text{වෙළෙඳපොල ඒකක මිල}} \times \frac{\text{වර්ෂයේ දින ගණන}}{\text{බිල්පත් කාලය}} \times 100$$

$$\text{ඵලදා අනුපාතිකය} = \frac{5}{95} \times \frac{365}{182} \times 100$$

$$\text{ඵලදා අනුපාතිකය (Y)} = 10.56\%$$

භාණ්ඩාගාර බිල්පතක ඵලදාව - උදාහරණයක්...

- $10.56 = \frac{100(100-P)}{P} \text{X} \frac{364}{182}$

  P = රු. 95

10.56% ක ඵලදාවක් ලබා ගැනීම සඳහා මෙම භාණ්ඩාගාර බිල්පතට රු. 95 ක් ගෙවිය යුතුය.

ලැබෙන පොළිය සත්‍ය දින ගණනට සමානුපාතිකව ලැබේ. එනම් දින 91, දින 182 හා දින 364

භාණ්ඩාගාර බැඳුම්කර සඳහා ප්‍රතිලාභ ලැබෙන ආකාරය

- මධ්‍ය හා දිගු කාලීන ණය උපකරණයකි
- අර්ධ වාර්ෂිකව පොළිය ලැබේ
- ප්‍රතිලාභ ලැබීම පිළිබඳ අවදානමක් නොමැත

$$P = \frac{C}{(1+i)^1} + \frac{C}{(1+i)^2} + \frac{C}{(1+i)^3} + \frac{C}{(1+i)^4} + \frac{C}{(1+i)^5} + \frac{C}{(1+i)^6} + \frac{M}{(1+i)^6}$$

P - මිල

C - අර්ධ වාර්ෂික පොළී ගෙවීම

i - අර්ධ වාර්ෂික වෙළෙඳපොල ඵලදාව

M - කල්පිරෙන දින ගෙවන මුදල

භාණ්ඩාගාර බැඳුම්කරයක ඵලදාව - උදාහරණයක්

- වාර්ෂික පොළී (කූපන් අනුපාතිකය) - 16%
- අර්ධ වාර්ෂික පොළී (කූපන් අනුපාතිකය) - 8% (16%/2)
- අර්ධ වාර්ෂික වෙළෙඳපොල ඵලදාව - 9% (18%/2)
- කාලය - වර්ෂ 3

$$P = \frac{8.00}{(1+0.09)^{\wedge}1} + \frac{8.00}{(1+0.09)^{\wedge}2} + \frac{8.00}{(1+0.09)^{\wedge}3} + \frac{8.00}{(1+0.09)^{\wedge}4} + \frac{8.00}{(1+0.09)^{\wedge}5} + \frac{8.00}{(1+0.09)^{\wedge}6} + \frac{100}{(1+0.09)^{\wedge}6}$$

P = රු. 95.51

මින් අදහස් වන්නේ 16% ක වාර්ෂික කූපන් අනුපාතිකයක් සහිතව වර්ෂ 3 අවසානයේ ලැබෙන රු. 100.0 ක බැඳුම්කරයක් මිලට ගැනීමට ආයෝජකයාට රු. 95.51 ක් ගෙවීමට සිදු වන බවයි.

භාණ්ඩාගාර බිල්පත් හා බැඳුම්කරවල ආයෝජනය කිරීමේ ප්‍රතිලාභ

- රජය විසින් නිකුත් කරන අතර 100%ක් අවදානමකින් තොර වේ. එනම් තැන්පතු මුදල සහ නියමිත පොළිය අදාල දිනයට ලැබේ.
- බදු සහ මුද්දර ගාස්තු වලින් නිදහස්ය.
- ද්වීතීයික වෙළෙඳපොල තුල ගනුදෙනු කිරීම හරහා ඉක්මනින් මුදල් බවට පත් කරගත හැක.
- සියලු ගනුදෙනු නවීන නිර්ලේඛන සුරැකුම්පත් පියවීම් පද්ධතියක් සහ ස්වයංක්‍රීය මධ්‍යම නිෂ්කාශන පද්ධතියක් හරහා ආරක්ෂාකාරීව සිදු කෙරේ.
- අවම අවධානමක් යටතේ ආයෝජනය කිරීමට කැමති පුද්ගලයන් සඳහා මෙය වඩාත් යෝග්‍ය වේ.

ගැටළු?

ස්තූතියි!